# බිගෝනියා පත්‍රයකින් පැල  බෝකරගන්නා ආකාරය

## බිගෝනියා පත්‍රයකින් පැල  බෝකරගන්නා ආකාරය :-



***පත්‍ර තෝරා ගැනීම :-***

හොඳින් මේරූ නටුව සහිත පත්‍ර ලබා ගැනීම

***රෝපන මාධ්‍ය :-***

ගංගා වැලි කොටස් 1

කොහුබත් කොටස් 1 හෝ හොඳන් දිරූ

පොල්ලෙලි කොටස් 1

ඉහත සඳහන් අනුපාතයට රෝපන මාධ්‍ය සකසා අඟල් 4 ගේජ් 250 - 300 කළු පොලිතින් ගෙන තවාන් මාධ්‍යයෙන් පුරවා ගන්න. අනතුරුව තවාන් මාධ්‍ය හොඳින් තෙත් කර වැඩිපුර ජලය ඉවත් වීමට සිදුරු යොදන්න. තෝරා ගත් බිගෝනියා පත්‍රයේ අඟල් 11/2 ක් පමණ දිගට නටුව කපා කැපූ ස්ථානයේ දිලීර නාශකයක් යොදන්න. ඉන් පසු තවාන් මධ්‍ය සහිත පොලිතින් බෑගයේ යටට වනසේ හා පත්‍රය හොඳින් මාධ්‍යයේ ස්පර්ශ වනසේ සිටුවන්න.



මීට අමතරව බිගෝනියා පත්‍රයේ v අකුරේ හැඩයට ප්‍රධාන නාරටිය කැපෙන සේ පත්‍ර කැබලි ගෙන ඉහත සඳහන් ආකාරයට සිට විය හැක.



සම්පූර්ණ බිගෝනියා පත්‍රයක්ම සිටුවා පැල විශාල සංඛ්‍යාවක් ලබා ගන්නා අකාරයක්ද ඇත. මෙහිදී තැටි පෝච්චි ගෙන ඉහත සඳහන් වගා මාධ්‍යයෙන් පුරවා ගනී. ඉන්පසු බිගෝනියා පත්‍රය ගෙන වගා මාධ්‍යයේ මතු පිට හොඳින් වගා මාධ්‍ය ස්පර්ශ වනසේ සිටුවා ගනී. අනතුරුව කුඩා කම්බි කොකු මගින් වගා මාධ්‍යයට හොඳින් සවි කරනු ලැබේ. ඉන් පසු සවිකර ගත් පත්‍රයේ ප්‍රධාන නාරටි දිගේ මුවහත් පිහියකින් කැපුම් යොදයි. සෙවන සහිත ස්ථානයක තැන්පත් කරයි. මෙසේ මෙම පත්‍රයෙන් පැල විශාල සංඛ්‍යාවක් ලබාගත හැක.

